# විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**පුහුණු උපදේශක උපදේශිකාවන් ලියාපදිංචි කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් විදේශ රැකියා අපේක්ෂිතයින් වෙනුවෙන් මෙහෙයවනු ලබන පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා සුදුසුකම්ලත් පුහුණු උපදේශක උපදේශිකාවන් **පුහුණු උපදේශක සංචිතයට ලියාපදිංචි කර ගැනීම සඳහා** අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. ජපන් භාෂා පුහුණු උපදේශක උපදේශිකාවන් ලියාපදිංචි කර ගැනීම (සිංහල / දෙමළ මාධ්‍යය)**

I. අධ්‍යාපන සුදුසුකම්

- පිළිගත් විශ්ව විද්‍යාලයකින් ජපන් භාෂාව පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ
- උපාධි පාඨමාලාවේ විෂයක් ලෙස ජපන් භාෂාව හදාරා තිබීම හෝ
- පිළිගත් දේශීය හෝ විදේශීය අධ්‍යාපන ආයතනයකින් ජපන් භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ ඊට සාමාන පාඨමාලාවක් හදාරා තිබීම හෝ
- ජපන් භාෂා ප්‍රවීනතාවය JLPT/NAT1,2,3 සමත්ව තිබීම.

II. සේවා පළපුරුද්ද

ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සමඟ,

- ජපන් භාෂාව පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් හෝ උපදේශකයෙකු වශයෙන් අවම වශයෙන් වසරක සේවා පළපුරුද්ද හෝ
- ගුරුවරයෙකු වශයෙන් හෝ උපදේශකයෙකු වශයෙන් අවම වශයෙන් වසරක සේවා පළපුරුද්ද

III වෘත්තීය සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

- අ.පො.ස. (සා.පෙ / උ.පෙ) විභාගය සඳහා ගෘහ ආර්ථික විද්‍යාව හදාරා තිබීම හෝ ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.
- ඉංග්‍රීසි, සිංහල, දෙමළ, අරාබි, හීබෲ, මැලේ,කොරියන් සහ හින්දි භාෂා පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ එම භාෂා හැසිරවීමේ හැකියාව.
- රූපලාවන්‍ය පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.
- සූපවේදය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.

Iv ඉගැන්වීමේ කුසලතාවය

- ඉගැන්වීමේ ක්‍රමවේදය (Teaching Methodology) පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.
- සම්මුඛ පරීක්ෂණයේදී ඉගැන්වීම් කුසලතාවය පිළිබඳව ප්‍රයෝගිකව පරීක්ෂා කරනු ලැබේ.

**02. සාත්තු සේවා වෘත්තිකයින් පුහුණු කිරීම සඳහා පුහුණු උපදේශක උපදේශිකාවන් ලියාපදිංචි කර ගැනීම (සිංහල / දෙමළ මාධ්‍යය)**

I. අධ්‍යාපන සුදුසුකම්

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෙද වෘත්තිය පිළිබඳ උපාධියක් ලබාතිබීම හෝ
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාත්තු සේවා වෘත්තිය පිළිබඳ උපාධියක් ලබාතිබීම හෝ
- පිළිගත් හෙද පුහුණු ආයතනයක NVQ 03 හෝ ඊට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ හෙද පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ
- පිළිගත් සාත්තු සේවා පුහුණු ආයතනයක NVQ 03 හෝ ඊට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ සාත්තු සේවා පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම

II. සේවා පළපුරුද්ද

ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සමඟ,

- හෙදියක හෝ සාත්තු සේවිකාවක වශයෙන් අවම වශයෙන් වසරක දේශීය හෝ විදේශීය සේවා පළපුරුද්ද

- ගුරුවරයෙකු/ පුහුණකරුවකු හෝ උපදේශක යෙකු වශයෙන් අවම වශයෙන් වසරක සේවා පළපුරුද්ද

IIII වෘත්තීය සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

- ඉංග්‍රීසි, සිංහල, දෙමළ, අරාබි, හීබෘ, මැලේ, කොරියන්, ජපන් සහ හින්දි භාෂා පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ එම භාෂා හැසිරවීමේ හැකියාව.
- අ.පො.ස. (සා.පෙ / උ.පෙ) විභාගය සඳහා ගෘහ ආර්ථික විද්‍යාව හදාරා තිබීම හෝ ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.
- සූපවේදය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.
- රූපලාවන්‍ය පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

Iv ඉගැන්වීමේ කුසලතාවය

- ඉගැන්වීමේ ක්‍රමවේදය (Teaching Methodology) පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.
- සම්මුඛ පරීක්ෂණයේදී ඉගැන්වීම් කුසලතාවය පිළිබඳව ප්‍රයෝගිකව පරීක්ෂා කරනු ලැබේ.

**03. මැදපෙරදිග / යුරෝපා හා නැගෙනහිර ආසියාතික රටවල් සඳහා වූ (ගෘහස්ථ) පුහුණු පාඨමාලා සඳහා පුහුණු උපදේශිකාවන් ලියාපදිංචි කර ගැනීම (දෙමළ මාධ්‍යය)**

I. අධ්‍යාපන සුදුසුකම්
   - අ.පො.ස. (සා.පෙ) විභාගය භාෂා විෂය සහ ගණිතයද ඇතුළුව සමත්ව තිබීම සහ
   - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ,
     - ගෘහපාලන සහයිකා මැදපෙරදිග පුහුණු පාඨමාලාව හෝ
     - ගෘහපාලන සහයිකා යුරෝපා හා නැගෙනහිර ආසියාතික රටවල් සඳහා වූ පුහුණු පාඨමාලාව හදාරා තිබීම සහ NVQ -03 සමත්ව තිබීම.

II. සේවා පළපුරුද්ද
   - ගෘහපාලන සහායිකාවක් වශයෙන් වෘත්තියේ අවම වශයෙන් වසර 04 ක් හෝ ඊට වැඩි කාලයක් විදේශ රටක සේවය කර තිබීම.

III. වෘත්තිය හා වෙනත් සුදුසුකම්.
   - ඉංග්‍රීසි, සිංහල, අරාබි, හීබෘ, මැලේ, කොරියන්, ජපන් සහ හින්දි භාෂා පිළිබඳ පාඨමාලා හදාරා තිබීම හෝ එම භාෂා හැසිරවීමේ හැකියාව.
   - අ.පො.ස. (සා.පෙ) හෝ අ.පො.ස. (උ.පෙ) විභාගය සඳහා ගෘහ ආර්ථික විද්‍යාව විෂය හදාරා තිබීම.
   - පිළිගත් ආයතනයකින් රූපලාවන්‍ය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම .
   - පිළිගත් ආයතනයකින් සූප ශාස්ත්‍රය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.

Iv ඉගැන්වීමේ කුසලතාවය

- ඉගැන්වීමේ ක්‍රමවේදය (Teaching Methodology) පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.
- සම්මුඛ පරීක්ෂණයේදී ඉගැන්වීම් කුසලතාවය පිළිබඳව ප්‍රයෝගිකව පරීක්ෂා කරනු ලැබේ.

**වෙනත් සුදුසුකම් (ඉහත සියළු තනතුරු සඳහා)**

- සියලුම අයදුම්කරුවන් 2020.09.14 දි වයස අවු.23 සම්පූර්ණ වී තිබිය යුතු අතර අවුරුදු 55 නොඉක්ම විය යුතුය.

**ලියාපදිංචි කර ගැනීමේ කොන්දේසි**

- පැවරුම් පදනම මත තාවකාලිකව **ලියාපදිංචි කරනු** ලැබේ.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත පැය පදනම මත ගෙවීම් සිදු කරනු ලැබේ.

- සේවා අවශ්‍යතාවය මත දිවයින පුරා පිහිටි කාර්යාංශ පුහුණු මධ්‍යස්ථාන වල සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.
- නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත **2020/10/07** දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය.
- තනතුරු දෙකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් වෙන වෙනම අයදුම්පත් ඉල්ලුම් කල යුතුය.
- ඉල්ලුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"පුහුණු උපදේශක උපදේශිකාවන් ලියාපදිංචි කර ගැනීම ජපන් භාෂා / සාත්තු සේවක / මැදපෙරදිග/ යුරෝපා හා නැගෙනහිර ආසියාතික "** යනුවෙන් සඳහන් කල යුතුය.

**කළමනාකරු - පරිපාලන හා මානව සම්පත් අංශය**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

**234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**

**කොස්වත්ත, බත්තරමුල්ල**

ආදර්ශ අයදුම්පත්‍රය - **ජපන් භාෂා / සාත්තු සේවක / මැදපෙරදිග / යුරෝපා හා නැගෙනහිර ආසියාතික පුහුණු උපදේශක උපදේශිකාවන් ලියාපදිංචි කර ගැනීම.**

1. මුලකුරු සමඟ නම :..............................................................................................
2. උපන් දිනය :..............................................................................................
3. ජා.හැ.අංකය :..............................................................................................
4. ස්ථිර ලිපිනය :..............................................................................................
5. දිස්ත්‍රික්කය :..............................................................................................
6. දුරකථන අංකය :..............................................................................................
7. අධ්‍යාපන සුදුසුකම් :..............................................................................................
8. භාෂා හැකියාව

| භාෂාව | ලිවීම | කථනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

9. වෘත්තිය හා වෙනත් සුදුසුකම් :..............................................................................................
10. පළපුරුද්ද

| සේවය කල ආයතනයේ නම සහ ලිපිනය (දේශීය-විදේශීය) | සේවා කාලය | තනතුර |
|---|---|---|
| | | |
| | | |
| | | |

මා විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

........................ ..................................................

දිනය අයදුම්කරුගේ අත්සන